# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2100/06 – 2018 දෙසැම්බර් මස 03 වැනි සඳුදා – 2018.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුපිට පත්තුව දකුණ සුළු කොට්ඨාසයේ, අංක 64 ඒ, අරන්දර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අරන්දර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේඊ/ජීඑල්ජී/2018/73 හා 2018.05.24 දිනැති ප්‍රග්මන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ හා බී වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.7505 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මයිලන්ඩ්ස් වත්ත – ප්‍රමාණය: හෙක්. 1.6942ක් පමණ**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී අටාලවත්ත බටුපිටිය කොටස සහ කොස්වත්ත කුඹුර; බටහිරට: කොස්වත්ත කුඹුර.

02. **කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0563ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ මාර්ගය; නැගෙනහිරට: අටාලවත්ත බටුපිටිය කොටස; දකුණට: අටාලවත්ත බටුපිටිය කොටස; බටහිරට: අටාලවත්ත බටුපිටිය කොටස සහ කැබලි අක්ෂර ඒ.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2018/වීඊ/09.
2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 - 424

1A – G29036 – 21 (2018/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*